
# ගස් අපේ මිතුරෝය




ජනුලි ෂෙනාරා හෙට්ටිආරච්චි

# ගස් අපේ මිතුරෝය


## ජනුලි ෂෙනාරා හෙට්ටිආරච්චි

(පළමු දිගහැරුම)

පාසල : මප/වත්/ දුම්බර රාජකීය ප්‍රාථමික විදුහල

ඉගෙනුම ලබන ශ්‍රේණිය : 5 ශ්‍රේණිය



කෘතිය පල කරන දිනය : 2025.02.08

ISBN 978-624-208-896-9

# පිදුම...

**මාගේ දයාබර දෙමාපියන් දෙපළට**

**සහ**

**මාගේ ආදරණීය**

**ගුරු මව්පියවරුන්ට**

**සෙනෙහසින් පුද කරමි...**





# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

කඳු යායකින් වටවුණු සිරිකඳුයාය කියලා සුන්දර ගම්මානයක් තිබුණා. එක ගෙදරක සරලා.. පවනි.. කියලා හොඳ කීකරු ළමයි දෙන්නෙක් සිටියා.






සරලා කියන්නේ අක්කා..

පවනි කියන්නේ නංගි... මේ දෙන්නා හැමදාම සවසට වත්ත පහළට යනවා සෙල්ලම් කරන්න. ඒ වත්ත මායිමෙන් ගලා බසින අලංකාර දොළ පාරක් තිබුණා.

සෙල්ලම් කරන එක් දවසක..

ඇතින් මිනිස්සු දෙන්නෙක් වත්ත පහළට එනවා දැක්කා.

එක් අයෙකුගේ අතේ පොරවක් තියෙනවා දැක්ක සරලා ගහකට මුවා වී බලන් හිටියා.






මේ මිනිස්සු දොළ ළඟ තිබුණු මහා ගසක් ළඟට ගිහින් පොරව අරගෙන ගහට කොටනවා දැක්ක සරලා සහ පවනී ඉක්මනට එතනට දුවගෙන ගියා.

දෙදෙනාම එක හඬින් අනේ... ගස් නැති උනොත් අව්ව සැර වැඩි වෙනවා.. ජලය සිඳී යනවා.. හුස්ම ගන්න බැරිවෙනවා...කියද්දී





කිසිම දෙයක් නොඇසූ ඒ මිනිස්සු ගස් කපා දැම්මා.

මෙහෙම දවසෙන්

දවස සිරිකඳුයායේ

තිබුණු ගස් සියල්ලම

කපා දැමුවා.

අව්රශ්මිය එන්න එන්නම වැඩි වුනා.

වත්ත පහළ තිබුණු ලස්සනට ගලා බසින දොළ පාරත් සිඳී ගියා.



සරුසාරව තිබුණු පොළොව ඉරි තැලී ගියා. සුළඟ එන්න එන්නම වැඩි වුණා. පාසැල ඇරී එන සරලා සහ පවනි වත්ත පහළට දිව යන්නේ වෙනදා මෙන් ආසාවෙන් නොවේ.

හරිම දුකින් .....

දෙදෙනාම ගස් කොටයක් උඩවාඩි වී ඈත බලාගෙන බොහෝ වෙලා කල්පනා කරනවා.

එක් දවසක සරලා නංගිට මෙහෙම යෝජනාවක් කළා..

අපි නංගි පැළ හිටවමු ..

අපේ ගම ලස්සන කරමු ..

පවනී සතුටට පත්වෙලා දෙන්නාම සතුටින් ආපසු ගෙදරට දිව්වා.

රාත්‍රියේදී සරලා සහ පවනී තාත්තාට මෙහෙම කියනවා. තාත්තේ අපට පැල ටිකක් ගෙනත් දෙන්න.. වත්ත පහළ හිටවන්න.

එන්න එන්නම අව්ව වැඩි වෙනවා. දොළ පාරේ මාළුන් මැරිලා ගිහින් .. වතුරත් නැහැ



ඉන්පසු මේ දෙදෙනාගේම කතාවට කැමති වූ තාත්තා දියණියන් දෙදෙනාගේ යහපත් ක්‍රියාව අගය කරමින් පසුදා ම උදෑසන කඩමණ්ඩියට ගිහින් පැළ ගොඩක් මිළ දී ගත්තා.

ඉන්පසු අම්මයි තාත්තයි සරලයි පවනියි පහළ වත්තේ ගස් සිටවන්න ගියා.



මේක දැකපු එහා වත්තේ නැන්දලා මාමලා ඒ වගේම ගම්වාසීන් හැමෝම සිරිකඳුයාය ගමේ පැළ සිටවන්නට පටන් ගත්තා.





මෙලෙස වසර ගණනක් ගෙවී ගියා.

සිරිකඳු යාය ගම්මානය නැවතත් තිබූ පරිදි ගස්වලින් පිරුණු කොළා පැහැයෙන් බබළන ආදර්ශමත් ගම්මානයක් බවට පත්වුණා.

දැන් සරලාට සහ පවනිට වගේම ගමේ ඉන්න හැමෝටමත් හරිම සතුටුයි. දැන් සිරිකඳුයායේ හැමෝම සතුටින් ජීවත් වෙනවා .




ගස් අපේ
මිතුරෝය...



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

# නිමි...